## රූපවාහිනිය



# ප්‍රථම සිංහල කාටූන් කතා මාලාව
# අහසින් වැටුණු කුමාරයා

බටහිර ලෝකයේ විශාල වශයෙන් ලාභ උපයන කර්මාන්තයක් වන කාටූන් වැඩ සටහන් නිෂ්පාදනය අපේ රටෙත් කරන්න බැරි ඇයි ද යන පැනය අප සිත් තුළ පැන නැගුනේ මීට අවුරුදු ගණනාවකට පෙර. අපේ රටේ දක්ෂතා යොදා ගෙන අපේ සංස්කෘතියට ගැලපෙන වැඩ සටහන් නිපදවා, ලාභදායී ව්‍යාපාරයක් වශයෙන් මෙය කරගෙන යාමට හැකි වේය යන විශ්වාසය අප තුළ තිබුණා.

පිටරට නිපදවනු ලැබූ වැඩසටහන් ගෙනැත් සිංහලෙන් හඬ කවා හෝ බොහෝ විට එසේ නැතිව අපේ රූපවාහිනී චැනල හැම එකක ම විකාශනය වුණා. ඔය අතර ලෝක ප්‍රසිද්ධ වුන හොඳ වැඩසටහනුත් තිබුණා. නමුත් වැඩි කොටසක් අවුරුදු ගණනාවක් පරණ, ඉතා අඩු මුදලකට ලබා ගත හැකි වූ එතරම් හොඳ නැති ඒවා. මුල් වැඩ සටහන ඒ අයුරින් ම පරිවර්තනය නොකර අපේ කමට කිට්ටු වන පරිදි සිංහලයට නගපු දෙස්තර හොඳහිත, පිස්සු පූසා වගේ වැඩසටහනක් ළමුන් අතර වඩාත් ජනප්‍රිය වුණා.

දේශීය බව සුරැකුණ වැඩසටහන් රූපවාහිනියෙන් දකින්න ළමුන් තුළ ඇති කැමැත්ත අප කළ සමීක්ෂණ කීපයක දී ම හෙළි වුණා. මේ පසුබිම තුළ තමයි කාටූන් හවුස් ආයතනය පිහිටවනු ලැබුවේ. මෙයට යොදා ගන්නා තාක්ෂණය සොයා ගැනීම සෑහෙන අපහසු කරුණක් වුණා. පරිගණක තාක්ෂණය පිළිබඳ විශේෂඥවරු කොපමණ සිටියත් ඔවුන් බොහොමයක ගේ විෂය පරිපථය වුනේ කායිකාල කටයුතු සඳහා අවශ්‍ය දෘඩාංග සහ මෘදුකාංග. Visual Computing Systems ආයතනයට හැකි වුණා අපට අදාළ ක්ෂේත්‍රයේ විස්තර අප වෙත සපයන්න. උපකරණ තෝරා ගත්ත අපට, ඊළඟ ගැටළුව වුණේ ශිල්පීන්, පළපුරුදු සජීවීකරණ ශිල්පීන් සොයා ගැනීම ඉතාමත් ම අපහසු වුණා. අපේ පාසල්වල හෝ විශ්වවිද්‍යාලයක හෝ වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක විෂය ධාරාවේ කාටූන් සජීවීකරණය යන්තමින් හෝ ඇතුළත්ව නොතිබීම මෙයට ප්‍රධාන ම හේතුවයි.

අපේ රටේම නිපදවා සිංහල හඬ යොදා තැනුණු ප්‍රථම කාටූන් කතා මාලාව වූ 'අහසින් වැටුණු කුමාරයා' වැඩසටහන මන්චි අනුග්‍රහයෙන් බ්‍රහස්පතින්දා ප.ව. 5.45 ට ජාතික රූපවාහිනියෙන් විකාශය කෙරෙනවා.
මෙම වැඩසටහන කාටූන් හවුස් ආයතනයේ නිෂ්පාදනයකි.

සෞන්දර්ය ආයතනයේ ගෞරව සාමාර්ථ සහිතව උපාධිය ලබා සිටි අමිතා ඉන්දිරානිත්, උසස් පෙළ සමත්ව එතැනට යාමට බලාපොරොත්තුව සිටි සුමිත් නිශාන්ත සහ තුසිත රුවන් දෙදෙනාත් කාටූන් හවුස් හි ප්‍රථම සජීවීකරණ ශිල්පීන් වුණා.

කාටූන් මෘදුකාංග අතරින් ඉහළ තැනක් හිමිකරගෙන සිටි Animo නිපදවූ Cambridge Animation Systems ආයතනයෙන් පැමිණි විශේෂඥවරියගෙන් ලැබූ පුහුණුවෙන් පසුව මේ පිරිස සජීවීකරණයට අත ගැසුවා. විවිධ පොත්පත් ඇසුරින්, වීඩියෝ පට නැරඹීමෙන් සහ ඒ ඔස්සේ අත්හදා බැලීම් කරමින් මේ අය සජීවීකරණය ප්‍රගුණ කළා, පළමු වසර ම මෙම අධ්‍යයන කටයුතුවලට යෙදවූවා.

ඒ අතරතුර තමයි "අහසින් වැටුණු කුමාරයා" නිපදවීම පටන් ගත්තෙ. ළමුන් අතර ජනප්‍රිය වෙලා තිබුණ පුරෝහිත චරිතයත්, කුමාරයා චරිතයත් පණ ගැන්විල පුංචි තිරයෙ දකිනකොට සජීවීකරණය කළ අයට මෙන් ම චරිතය නිර්මාණය කළ හිගුල්වල දිසානායකටත් ඇතිවුණේ මහත් සතුටක්. හර්ෂ මාකලන්ද පසුබිම් සංගීතය නිර්මාණය කිරීමට කැමැති වීම අධ්‍යක්ෂක පාලිත ලක්ෂ්මන්ට ලොකු ධෛර්යයක් වුණා. අහසින් වැටුණු කුමාරයා ජාතික රූපවාහිනියේ විකාශය වීම යනු මේ හැම දෙනාගේ ම සිහිනයක් සැබෑවීමක්. මේ සිහිනය සැබෑ කරගන්න සිහින දැකපු අය සෑහෙන්න කැපවෙලා වැඩ කළා. ❑



**චන්දන ප්‍රනාන්දු**